කළුතර අධ්‍යාපන කළාපය
දෙවන වාර ඇගයීම - 2018

11 ශ්‍රේණිය | **කෘෂි හා ආහාර තාක්ෂණය - I පත්‍රය** | **කාලය පැය එකයි**

සැලකිය යුතුයි:

- **සියලුම ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.**
- **අංක 01 සිට 40 දක්වා ප්‍රශ්න වලට දී ඇති පිළිතුරු වලින් නිවැරැදි හෝ වඩාත්ම ගැලපෙන පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.**

1.ශ්‍රී ලංකාවේ බහු කාර්යය ගොවි ජනපද ආරම්භ වූ වර්ෂය වන්නේ,
(1) 1930 (2) 1933 (3) 1958 (4) 1960

2.යෝධ ඇළ හරහා ජලය ගෙන ගියේ,
(1) මින්නේරිය වැවේ සිට කලා වැවටය. (2) කලාවැවේ සිට කන්තලේ වැවටය.
(3) කන්තලේ වැවේ සිට තිසා වැවටය. (4) කලා වැවේ සිට තිසා වැවටය.

3.වායු ගෝලීය උෂ්ණත්වය මැනීම සඳහා පාඨාංක ලබා ගැනීමට පොළව මට්ටමේ සිට උෂ්ණත්ව මානය තැබිය යුතු උස වන්නේ,
(1) මීටර් 0.5 කි. (2) මීටර් 1.2 කි. (3) මීටර් 1.7 කි. (4) මීටර් 2 කි.

4.වා සුළි වැසි ඇති වීමට වැඩි ප්‍රවණතාවක් ඇති කාලය වන්නේ,
(1) මාර්තු ය. (2) ජූනි ය.
(3) අගෝස්තු ය. (4) දෙසැම්බර් ය.

5.පසක කේෂ්ත්‍ර ධාරිතාව හා මැලවීමේ අංක පරාමිතින් අවශ්‍ය අවස්ථාවක් වන්නේ,
(1) පොහොර යෙදීමේදීය. (2) ජල වහනයේදීය.
(3) ජල සම්පාදනයේදීය. (4) බෝග සංස්ථාපනයේදීය.

6.කැට අයන හුවමාරු ධාරිතාවේ වැදගත් කමක් වන්නේ,
(1) පසේ වාතනය දියුණු කිරීමටය.
(2) පසේ බැක්ටීරියා ක්‍රියාකාරිත්වය දියුණු කිරීමටය.
(3) පසේ පෝෂක රඳවා තබා ගැනීමටය.
(4) ආම්ලික අයන වල ද්‍රව්‍යතාව වැඩි කිරීමටය.

7.මාෂ බෝග කාණ්ඩයට අයත් බෝග නිවැරැදිව දක්වා ඇති පිළිතුර වන්නේ,
(1) මුං, කව්පි සහ උඳු ය. (2) වී, මුං සහ කුරක්කන් ය.
(3) උඳු, වී සහ කුරක්කන් ය. (4) උඳු, මුං සහ වී ය.

8.පොළිසියේ කුලයේ බෝග වගා කර ඇති කේෂත්‍රයකට තෝරා නසන වල් නාශකයක් යෙදූ විට විනාශ වන ශාකයක් වන්නේ,
(1) වී ය. (2) උක් ය. (3) මෙනේරි ය. (4) උඳු ය.

9.අතුරුයත් ගෑමේ උපකරණ කාණ්ඩය නිවැරදිව දක්වා ඇත්තේ,
(1) යකඩ නගුල, රේක්කය, කොනෝ වීඩරය.
(2) රිජරය, රේක්කය, තුන් පුරුක් කල්ටිවේටරය.
(3) කොනෝවීඩරය, ටූල් කැරියර්, සුවිස් හෝව.
(4) ටූල් කැරියර්, සුවීස් හෝව, රිජරය.

10.පහත දක්වා ඇත්තේ බිම් සැකසීම පිළිබඳව ප්‍රකාශ කිහිපයකි,

A – පස පෙරළීම.
B – කැට පොඩි කිරීම.
C – මට්ටම් කිරීම.
D – පාත්ති සකස් කිරීම.

ඉහත ද්විතීයික බිම් සකස් කිරීම හා සම්බන්ධ වන්නේ,
(1) A, B හා C ය. (2) A, B හා D ය. (3) A, C හා D ය. (4) B, C හා D ය.

11.එක ළඟ පිහිටි උස් තවාන් පාත්ති දෙකක් අතර තිබිය යුතු අවම පරතරය වන්නේ,
(3) 15 cm ය. (3) 20 cm ය. (3) 25 cm ය. (3) 30 cm ය.

12.තවාන් පාත්තියක් සකස් කිරීමේදී මතු පිට පස් හා කාබනික පොහොර මිශ්‍රණය පිරවිය යුතු සනකම වන්නේ,
(1) 2 cm ය. (2) 5 cm ය. (3) 7 cm ය. (4) 10 cm ය.

13.පළතුරු ශාකවල අනවශ්‍ය අතු හා පත්‍ර ඉවත් කිරීම මගින්,
(1) ප්‍රභාසංස්ලේෂණය අඩු කළ හැකිය. (2) පෘෂ්ඨීය අපදාවය අඩු කළ හැක.
(3) ශ්වසන අඩු කළ හැකිය. (4) උත්ස්වේදනය අඩු කළ හැකිය.

14.ඉසින ජල සම්පාදනයේ අවාසියක් වන්නේ,
(1) බෑවුම් ඉඩම් වලට සුදුසු නොවීම.
(2) පාංශු බාදනය සිදු වීම.
(3) වාෂ්පීකරණයෙන් ජලය අපතේ යෑම.
(4) වැඩි ජල ප්‍රමාණයක් අවශ්‍ය වීම.

15.වී වගාවේ බණ්ඩි පොහොර (T.D.M) මිශ්‍රණයෙහි අඩංගු ප්‍රධාන ශාක පෝෂකය වන්නේ,
(1) N, P හා K ය. (2) N හා P ය. (3) N හා Kය. (4) P හා K ය.

16.කොම්පෝස්ට් නිෂ්පාදනයේදී ගන්නා නයිට්‍රජන් බහුල අමුද්‍රව්‍යයන් වන්නේ,
(1) රනිල ශාක පත්‍ර (2) තෘණ (3) පිදුරු (4) ජලජ පැළෑටි.

17.පිපිඤ්ඤා පත්‍ර විචිත්‍ර රෝගය ඇති කරන වෛරසයේ ධාරකයෙකු ලෙස ක්‍රියා කරන වල් පැළෑටියක් වන්නේ,
(1) කළාදුරු ය. (2) තුනැස්ස ය. (3) මාන ය. (4) හුලංතලා ය.

18.ගොලුබෙල්ලන් මර්ධනයට ගන්නා පළිබෝධ නාශකයක් වන්නේ,
(1) මෙටැල්ඩිහයිඩ් (2) කබෝපියුරාන් (3) කාබරීල් (4) ගෙන්දගම්

19.බිත්තර වී වල තිබිය යුතු උපරිම තෙතමන ප්‍රතිශතය වන්නේ,
(1) 10% ක්. (2) 13% ක්. (3) 25 % ක්. (4) 40 % ක්.

20.පැළ සිටුවීමේ යන්ත්‍ර මගින් වී බෝගය ක්ෂේත්‍රයේ පිහිටුවීම සඳහා යෝග්‍ය තවාන් වර්ගය වන්නේ,
(1) මඩ තවාන. (2) තැටි තවාන. (3) ඩැපොග් තවාන. (4) කුට්ටි තවාන.

21.ඒක බීජ පත්‍රී බීජ වල ආහාර තැන්පත් වී ඇත්තේ,
(1) බීජ පත්‍ර වලය. (2) භ්‍රෑණ පෝෂයේය.
(3) ඵලාවරණයේය. (4) බීජාධරයේය.

22.සිටුවීම සඳහා වඩාත් සුදුසු දඬු කැබලි වන්නේ,
(1) සක්‍රිය දඬු කැබලි. (2) අක්‍රිය දඬු කැබලි.
(3) අක්‍රිය වීමට ආසන්න දඬු කැබලි. (4) සක්‍රිය වීමට ආසන්න දඬු කැබලි.

23.පටක රෝපණයේ වාසියක් වන්නේ,
(1) රෝගී මව් ශාකයක් නිරෝගී පැළ ලබා ගැනීමට හැකි වීම.
(2) ඉහළ තාක්ෂණික දැනුමක් අවශ්‍ය නොවීම.
(3) මූලික වියදම අඩුවීම.
(4) කටුක පරිසර වලට ඔරොත්තු දීමේ හැකියාව තිබීම.

24.නිර්පාංශු වගාවේ පෝෂණ මාධ්‍යක තිබිය යුතු pH පරාසය වන්නේ,
(1) 2.5 – 3.4 අතරය. (2) 3.3 – 4.5 අතරය.
(3) 5.8 – 6.5 අතරය. (4) 7.0 – 7.5 අතරය.

25.දැල් ගෘහ සඳහා භාවිතා කරන 75% සෙවන දැල් යොදාගන්නේ කුමන බෝගය සඳහාද,
(1) ඕකිඩ්. (2) ඇන්තූරියම්. (3) රෝස. (4) බෝගන්විලා.

26.ඒකීය සූර්ය ප්‍රචාරකයක රෝපණ මාධ්‍ය ලෙස ගන්නේ,
(1) මතුපිට පස් හා කාබනික පොහොර 1:1 මිශ්‍රණය.
(2) මතුපිට පස් හා කාබනික පොහොර 2:1 මිශ්‍රණය.
(3) වැලි, කොම්පෝස්ට් හා මතුපිට පස් 1:1:1 මිශ්‍රණය.
(4) වැලි, කොම්පෝස්ට් හා මතුපිට පස් 2:1:1 මිශ්‍රණය.

27.හේන් ගොවිතැනේදී කැලෑව ගිනි තැබීම සිදු කරන කාල වකවානුව වන්නේ,
(1) පෙබරවාරි සිට මාර්තු දක්වාය. (2) ජුනි සිට ජූලි දක්වාය.
(3) අගෝස්තු සිට සැප්තැම්බර් දක්වාය. (4) ඔක්තෝබර් සිට නොවැම්බර් දක්වාය.

28.භූමියක පස ජලය පෝෂක හා ජෛව විවිධත්වය ආරක්ෂා වන පරිදි අවම යෙදවුම් භාවිත කරමින් පරිසරය සුරක්ෂිත වන අයුරින් පවත්වා ගෙන යන ගොවිතැන් ක්‍රමය වන්නේ,
(1) සංරක්ෂණ ගොවිතැන ය. (2) සමාධානික ගොවිතැන ය.
(3) හේන් ගොවිතැන ය. (4) ගෙවතු වගාව ය.

29.එක් බෝගයක ජීවන චක්‍රය අවසන් වීමට පෙර තවත් බෝගයක් පළමු බෝගය අතර සංස්ථාපනය කරමින් බෝග වර්ග දෙකක් හෝ කිහිපයක් එකම භූමියේ වගා කිරීම හඳුන්වන්නේ,
(1) ශෂ්‍ය බෝග මාරුව. (2) අතුරු බෝග වගාව.
(3) මිශ්‍ර බෝග වගාව. (4) කඩින් කඩ වගාව.

30.ශ්‍රී ලංකාවේ පසු අස්වනු හානිය බහුලව සිදුවන අවස්ථාවක් වන්නේ,
(1) අස්වනු නෙලීමේදී ය. (2) අස්වනු පිරිසිදු කිරීමේදී ය.
(3) අස්වනු ඇසිරීමේදී ය. (4) අස්වනු ප්‍රවාහනයේදී ය.

31.අස්වනු හානියට බලපාන අභ්‍යන්තර සාධකයක් වන්නේ,
(1) බෝගයේ ශ්වසනය. (2) පළිබෝධ හානිය.
(3) අයහපත් පරිහරණ විධිය. (4) අයහපත් දේශගුණික තත්වයන්ය.

32.අස්වනු නෙලීමේදී නටුවේ දිග නියමිත ප්‍රමාණයට නොතිබීම නිසා පසු අස්වනු හානි සිදුවන බෝගයක් වන්නේ,
(1) පැපොල් ය. (2) අන්නාසි ය. (3) අඹ ය. (4) මිදි ය.

33.සත්ව පිෂ්ඨ ලෙස හඳුන්වන්නේ,
(1) සුක්‍රෝස් ය. (2) ලැක්ටෝස් ය.
(3) ග්ලයිකොජන් ය. (4) ෆෘක්ටෝස් ය.

34.රක්තහීනතාව ඇති වීමට හේතු වන්නේ පහත සඳහන් කුමන ඛණිජය ඌන වීමෙන්ද,
(1) කැල්සියම්. (2) පොස්පරස්. (3) යකඩ. (4) අයඩින්.

35.ආසියාතික රටක, සුදුසු බරෙහි සිටින වැඩිහිටියකුගේ BMI අගය වන්නේ,
(1) 18.5 ට අඩු (2) 18.5 – 22.9 අතර.
(3) 23.0 – 26.9 අතර (4) 27.0 ට වැඩි.

36.රට කජු වලට ඇස්පජිලස් දිලීරය මගින් එක් කරන විෂ ද්‍රව්‍ය වන්නේ,
(1) ඇෆ්ලටොක්සින්ය. (2) ලිනමරීන්ය.
(3) කැඩ්මියම්. (4) සයනයිට්.

37.පුවත්පත් කඩදාසි වල ආහාර ද්‍රව්‍යය දැවටීම නිසා ශරීරයට එකතුවී රෝගී තත්ව ඇති කරන්නේ,
(1) ඇලුමිනියම් ය. (2) ඊයම් ය.
(3) මැග්නීසියම් ය. (4) කොපර් ය.

38.හාල්මැස්සන් සමඟ තක්කාලි නිතර නිතර ආහාරයට ගැනීම නිසා ඇතිවන රෝගී තත්ත්වයක් වන්නේ,
(1) මූත්‍රා ගල් ඇති වීම. (2) පේෂි දුර්වල වීම.
(3) පාචනය (4) කෙණ්ඩා පෙරලීම.

39.ආහාර පරිරක්ෂණයේදී සියලු ක්ෂුද්‍ර ජීවීන් මෙන්ම බීජානුද විනාශ වන්නේ,
(1) පැස්චරීකරණයේදීය. (2) ජීවානුහරණයේදීය
(3) සාන්ද්‍රීකරණයේදිය (4) පැසවීමේදීය.

40.ප්‍රබල කල ආහාරයක් වන්නේ,
(1) අයඩින් එකතු කල ලුණු. (2) විටමින් එකතු කල කිරිපිටි.
(3) බ්ලාන්විකරණය කල එළවළු. (4) දුම්ගැසූ මස්.